// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 2288/18 - 2022 ජූලි මස 12 වැනි අඟහරුවාදා - 2022.07.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**වන්දනා ගමන් ආඥාපනත**

2022 වසරේ තිරුක්කෝවිල් ශ්‍රී සිත්තිරවේලායුද සුවාමි කෝවිල් වාර්ෂික උත්සවය

**අම්පාර දිස්ත්‍රික්කයේ තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

තිරුක්කෝවිල් ශ්‍රී සිත්තිරවේලායුද සුවාමි කෝවිලේ 2022 වර්ෂයේ වාර්ෂික උත්සවය 2022.07.11 වන දින ආරම්භ වී 2022.07.28 වන දින නිම වන බව සියලු වන්දනා බැතිමතුන් වෙත මෙයින් දන්වනු ලැබේ.

1951 මැයි මස 11 වන දින අංක 10247 දරන *රජයේ ගැසට් නිවේදනයේ* සඳහන් විධිවිධාන හා රෙගුලාසිවලට අනුකූලව මෙම උත්සව කාලසීමාව තුළ කටයුතු කරන ලෙස සියලු වන්දනාකරුවන්ට, බැතිමතුන්ට හා අනිකුත් සියලු පොදු ජනතාවට ඉතා ගෞරව පූර්වකව මෙයින් දන්වනු ලැබේ.

මෙම උත්සවය වෙනුවෙන් බලපැවැත්වෙන නිල මායිම් සීමාවන් පහත සඳහන් පරිදි වන බව කරුණාවෙන් සලකන්න.

*උතුර* : මහ විද්‍යාලය පාර තම්බිලුවිල් ;
*නැගෙනහිර* : ධීවර පාර තිරුක්කෝවිල් ;
*දකුණ* : මුහුදු වෙරළ පාර තිරුක්කෝවිල් ;
*බටහිර* : ප්‍රධාන පාර තිරුක්කෝවිල්.

**ටී. ගජේන්තිරන්,**
ප්‍රාදේශීය ලේකම්.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
තිරුක්කෝවිල්.

EOG 07 - 0067

1A - G 37069 — 36 (2022/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*